**අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු වටිනාකම රු. 34,792 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (ii) | දෙබොක්කාව මහජන සතිපොළ බදුදීම හා සංචාරක වෙළඳ වාහන වලින් ගාස්තු අයකිරීමට අදාළව ආරක්ෂිත තැන්පතු වටිනාකම රු. 258,501 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | වැරදීමකින් වැඩිපුර ආරක්ෂිත ඇප තැන්පතු අයකර ගත්තෙමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට අයත් පිරිවැය රු. 775,000 ක් වූ ගොඩනැගිලි 07 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iv) | ප්‍රාදේශීය සභාවට අයත් නොවන වටිනාකම රු. 40,000 ක් වූ ඉඩම් දෙකක් වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සභාවට අයත් වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කරමි |
| (v) | සමාලෝචිත වර්ෂයේදී අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය වෙනුවෙන් ලැබිය යුතු රු.703,285 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අතපසු වීමකින් ණයගැති වටිනාකම ගිණුම්ගත කර නොමැති අතර, ඉදිරි වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරමි |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂයේදී නගරයේ ප්‍රධාන වට රවුමේ ආරක්ෂිත වැට ඉදිකිරීම වෙනුවෙන් වැයකර තිබූ රු. 37,305 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 2,122,414 ක් වූ උසාවි දඩ ශේෂය හා ඊට අදාළ උපයෝගී ලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු. 65,068 ක අසමානතාවයක් පැවතුණි. | අදාළ ශේෂයෙහි වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | උසාවි දඩ වෙනුවෙන් මාසික උපලේඛන ලද පසු ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 128,677,111 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අදාළ උපලේඛන යාවත්කාලීන කර ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් දේපල ලැයිස්තු විස්තරය සංශෝධනය කරමින් පවතින අතර එය කඩිනමින් නිම කර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරමි |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 02 | වාහන ආදායම් බලපත්‍ර ලබාගැනීමට ගෙවූ රු. 35,670 ක දඩ මුදල වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මහා සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණයක් මත දඩ මුදල් ගෙවා ආදායම් බලපත්‍ර ලබා ගන්නා ලදී |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>----------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවත්, 2008 සිට 2013 දක්වා ලබා දී තිබූ රු.264,935 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමි |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වසර දෙක ඉක්මවූ වටිනාකම රු. 1,595,163 ක් වූ විවිධ තැන්පත් ශේෂ 236 ක් සහ සියයට 10 රඳවුම් මුදලක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වසර 02 ඉක්ම වූ තැන්පත් ශේෂ සහා ආදායමට බැර කර ගැනීමට කඩිනමින් කටයුතු කරමි |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 04 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | ඉදිරියේදී ඉන්ධන දහනය කිරීමේ පරීක්ෂාවන් සිදු කරමි |

**2.** **මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම, රු. 2,046,597 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,703,288 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු ගිණුමේ බැංකු සැසඳුම් වාර්තාව අනුව මුදල් පොතේ ශේෂයත් ශේෂ පත්‍රයේ ශේෂයත් අතර රු. 12,000 ක වෙනසක් විය. | අදාළ වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 485,000 | 614,030 | 583,960 | 168,266 | 310,000 | 362,595 | 330,095 | 262,361 |
| කුලී | 12,488,800 | 12,082,712 | 11,915,273 | 715,195 | 12,063,500 | 13,180,863 | 12,463,446 | 1,563,323 |
| බලපත්‍ර ගාස්තු | 1,075,300 | 1,282,652 | 1,280,652 | 45,000 | 1,021,500 | 809,104 | 801,079 | 97,965 |
| වෙනත් ආදායම් | 4,829,800 | 5,149,232 | 1,611,043 | 6,634,930 | 7,086,800 | 4,064,878 | 3,729,895 | 4,069,451 |
| | 18,878,900 | 19,128,626 | 15,390,932= | 7,563,391 | 20,481,800 | 18,417,440 | 17,324,515 | 5,993,100 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 25,121,726 ක් වුවද, වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු. 15,390,932 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 61 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු. 4,900,000 ක් සභාව වෙත ලැබී නොමැති අතර, හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි |

**2.3.3** ව්‍යාපාර බදු

------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපාර ඒකක 84 කින් අයවිය යුතු ව්‍යාපාර බදු රු. 166,380 ක් වූ අතර එම හිඟය අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | හිඟයෙන් කපාහැරීම සඳහා හඳුනාගන්නා ලද ශේෂ කපා හැරීමට කටයුතු සිදු කරමින් පවතින බව හා ඉතිරිය ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි |

**2.3.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018දෙසැම්බර් 31දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු .2,122,414ක් හා මුද්දර ගාස්තු රු .4,468,847ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී |

**3.** මෙහෙයුම් සමාලෝචනය

-------------------------

**3.1** කාර්ය සාධනය

--------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ . | ඉලක්ක සෘජුව සපුරා ගැනීම සඳහා දීර්ඝ කාලීන සැලැස්මක් සභාව සතුව නොමැති වුවද සභාව මගින් කරනු ලබන බහුතරයක් වැඩසටහන් මෙම තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට වක්‍රව බලපා ඇත |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් සහා අරමුදලින් ඉටු කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා 25 කින් සංවර්ධන යෝජනා 02 ක් පමණක් ඉටු කර තිබුණි. | අයවැය ලේඛනයේ ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | 2018 වර්ෂයේ අප්‍රේල් මාසයේ ප්‍රාදේශීය සභාවට මහජන නියෝජිතයින් පත් වී පැමිණීමත් සමඟ එම නියෝජතයින්ට අවශ්‍ය සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව විසින් සේවකයන් 09 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලේකම් තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙකු පත් කරන තෙක් විශ්‍රාමික රජයේ නිලධාරිනියක් කොන්ත්‍රාත් පදනමින් පත්කර ඇත. ආදාහනාගාර ක්‍රියාකරු, අදාහනාගාර ක්‍රියාකරු සහායක, සෞඛ්‍ය කම්කරු තනතුරු 02 ක් සඳහා අලුතින් බඳවා ගැනීමට ගැසට් කර සම්මුඛ පරීක්ෂණද පවත්වා එම තීරණ අනුමැතියට පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති අතර ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ඉල්ලීම් කරන ලදී |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාවෙන් ඉවත් වී ගිය නිලධාරියෙකුගේ සේවක ඇප තැන්පත් රු. 14,698 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පත් ශේෂය කඩිනමින් නිරවුල් කළ යුතුවේ. | රු. 14,698 ක් වන සේවක ඇප තැන්පත් ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව විසින් භාවිතයට ගනු ලබන රු. 7,826,130 ක් වූ ඉඩම් 20 ක සහ රු. 1,935,000 ක් වූ ගොඩනැගිලි 12 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් වල අයිතිය සභාව වෙත පවරාගත යුතුවේ. | ඉඩම්, ගොඩනැගිලි පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමි |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් වට්නාකම තක්සේරු නොකර භුක්ති විදින ඉඩම් 25 ක අයිතිය සමාලෝචිත වර්ෂයේදීත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් වල අයිතිය සභාව වෙත පවරාගත යුතුවේ. | ඉඩම් පවරා ගැනීමට හා වට්නාකම් තක්සේරු කිරීමට කටයුතු සිදු කරමි |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ----------- | --------------------------- |
| (අ) | වාර්ෂික අයවැයෙහි ඇතුළත් රු. 10,000 ඉක්ම වූ වැය විෂයයන් 14 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.7,496,500 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදී වැයකර නොතිබුණි. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අයවැය පාලනය සම්බන්ධයෙන් පෙන්වා දී ඇති කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඉදිරියේදී කටයුතු කරමි |
| (ආ) | ආදායම් විෂයයන් තුනක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 28,399,537 ක් වූ අතර, එය සියයට 33 සිට සියයට 35 දක්වා පරාසයක විය. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අයවැය පාලනය සම්බන්ධයෙන් පෙන්වා දී ඇති කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඉදිරියේදී කටයුතු කරමි |
| (ඇ) | වියදම් විෂයයන් හතරක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 1,707,606 ක් වූ අතර එය සියයට 21 සිට සියයට 41 දක්වා පරාසයක විය. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අයවැය පාලනය සම්බන්ධයෙන් පෙන්වා දී ඇති කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඉදිරියේදී කටයුතු කරමි |
| (ඈ) | වියදම් විෂයයන් 04 ක එකතුව රු. 27,491,403 ක් වූ ඉතිරිවීම් පැවති අතර එය සියයට 35 සිට සියයට 70 දක්වා පරාසයක විය. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අයවැය පාලනය සම්බන්ධයෙන් පෙන්වා දී ඇති කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඉදිරියේදී කටයුතු කරමි |